# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,928 — 1970 ඔක්තෝබර් 16 වැනි සිකුරාද — 1970.10.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට |
|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 135 |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම් .. ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම .. ... | — |
| පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම් .... ... ... | 135 |
| මුදල් නඩු පිළිබඳ දන්වීම් ... ... ... | 136 |
| නීති අධ්‍යාපන සභාවේ දන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව | — |
| විවිධ දන්වීම් ... ... ... | — |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍ර විනිශ්චයකාර ධුරන්ධර හියු නෝමන් ග්‍රෙගරි ප්‍රනාන්දු වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා එයට සෑහෙන කරුණු පෙනී, ශ්‍රේෂ්ඨාධිකරණයේ බටහිර චාරිකාව සඳහා 1970 ඔක්තෝබර් මස 23 වැනි කිවි දින සිට මීගමුවේදී අතිරේක අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

එච්. ඇන්. ජී. ප්‍රනාන්දු,
අග්‍ර විනිශ්චයකාර.

1970 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

10-414

## පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම්

### වයඹ පළාත

### කුරුණෑගල දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

වල්ගම්පත්තු කෝරළේ ගෝනිගල පදිංචි ඩබ්ලිව්. එම්. හේරත් බණ්ඩා ........................................ පැමිණිලිකාරයා.

නොම්මරය: 2997/එම් — එදිරිව

වල්ගම්පත්තු කෝරළේ දම්පිටියේ පදිංචි ඉලන්කෝන් මුදියන්සෙලාගේ බණ්ඩාර මැණිකා ........................ විත්තිකාරී.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරියට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයන් වර්ෂ 1970ක් වූ නොවැම්බර් මස 11 දින පෙරවරු 10.30ට එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

**අයවිය යුතු මුදල:** රුපියල් හාරදාස් හාරසිය හැත්තෑඑකයි ශත තිස් හත හමාරකි, (රු. 4,471.37½) සහ පිස්කල් ගාස්තු ආදිය.

#### උපලේඛනය

1. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ වල්ගම්පත්තු කෝරළේ දම්පිටියේ තිබෙන හිටිනාවත්ත නොහොත්

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1970 ජූනි මස 2 වැනි දින,
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


135——ඕ 69856—5,728 (70/10)

වෙල් කොටුවේ වත්ත කුරක් කන් හයලාහක වපසරිය ඇති ඉඩමට මායිම් :—උතුරට : කිරිමුදියන්සේට අයිති ඉඩමේ වැට සහ අගල ; නැගෙනහිරට : ගම්සහා පාර ; දකුණට : කිරිබණ්ඩා සහ තවත් අයගේ ඉඩමේ වැට සහ බස්නාහිරට : කිරිබණ්ඩා සහ තවත් අයගේ ඉඩමේ වැට සහ මායිම් තුළ අංක ඕ. 513/77 හි ලියාපදිංචි ඉඩමෙන් දෙකෙන් පංගුව.

2. එම ගම තිබෙන අඹගහමුල වත්ත කුරක් කන් කුරිනි හයක (6) වපසරියට මායිම් :— උතුරට : හේරත් හාමිගේ ඉඩම ; නැගෙනහිරට : පුංචිබණ්ඩාගේ ඉඩම ; දකුණට : වෙල ; බස්නාහිරට : හේරත් හාමිගේ ඉඩම යන මායිම් තුළ ඉඩමෙන් නොබෙදූ දෙකෙන් පංගුව. ලියාපදිංචි අංකය : ඕ. 513/82.

ඉහත කී 1 වෙනි සහ 2 වෙනි ඉඩම් දැනට එක ඉඩමක් වූ අක්කර 10, රූඩ් 2, පර්චස් 26 ක් විශාල හිටිනාවත්ත නොහොත් වෙල් කොටුවේ වත්ත සහ අඹගහමුල වත්ත යන ඉඩම්වලට දැනට එකට මායිම් :—උතුරට : පූන්චිබන්ඩා සහ තවත් අයට අයිති ඉඩමේ වැට ; නැගෙනහිරට : මහපාර සහ අප්පුහාමිගේ ඉඩමේ වැට ; දකුණට : කිනගස් පිටියට යන පාර සහ බස්නාහිරට : වෙල. මෙම ඉඩමේ නොබෙදූ දෙකෙන් පංගුව.

ඩබ්ලිව්. ඩබ්ලිව්. වැත්තැව,
වයඹ පළාතේ පිස්කල් වෙනුවට.

1970ක්වූ ඔක්තෝබර් මස 5 වෙනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

10-571

---

# මුදල් නඩු පිළිබඳ දැන්වීම්

## ගම්පහ දිස්ත්‍රික් උසාවියේදීය

### නයිසයි ආඥාවයි

තෙස්තමේන්තු නඩු නො. 1080/මුදල්. පහල ඉබුල්ගොඩ පදිංචිව සිට නැසීගිය අම්පෙ මොහොට්ටිගේ දෙන් කරෝලිස් අප්පුහාමිගේ අන්තිම කැමති පත්‍රයක් නොමැති මුදලය පිළිබඳ කාරණාව ගැනයි.

පහල ඉබුල්ගොඩ පදිංචි අම්පෙ මොහොට්ටිගේ පද්මිණි චන්ද්‍රලතා .................................................. පෙත්සම්කාරිය.

එදිරිව

පහල ඉබුල්ගොඩ පදිංචි ජයසූරිය ආරච්චිගේ දෝන ඇලෝනෝනා ජයසූරිය .................................................. වගඋත්තරකාරිය.

මෙම කාරණය 1970 ක්වූ ජූලි මස 29 වෙනි දින ගම්පහ දිස්ත්‍රික් නඩුකාර තැන්පත් කේ. ඒ. පී. රණසිංහ මහතා ඉදිරිපිට, ඉහත කී පෙත්සම්කාරිය වෙනුවෙන් ඇස්. ඕ. සී. ඩබ්ලිව්. සේනාරත්න පෙරකදෝරු මහතා පෙනී සිටියදී විභාගය පිණිස ගෙන පෙත්සම්කාරියගේ 1970ක්වූ ජූලි මස 26 දින දරණ දිවුරුම් පත්‍රය කියවා බලා.

ඉහත කී වගඋත්තරකාරිය හෝ මෙම මුදලයට සම්බන්ධකම් ඇති වෙනත් අයෙකු හෝ අයවලුන් විසින් 1970ක් වූ ඔක්තෝබර් මස 23 දින හෝ එදිනට මත්තෙන් මෙම උසාවියට ඒත්තු යනාකාර සැහෙන විරුද්ධවාදිකම් දක්වා නොසිටියහොත් ඉහත කී පෙත්සම්කාරිය ඉහත කී නැසීගිය අයගේ දුව වන හෙයින් එම නැසීගිය අයගේ මුදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාත් බලකඩදාසි පෙත්සම්කාරි වෙත නිකුත් කරන්නට යෙදෙන බව මෙයින් ප්‍රකාශ කරන්නට යෙදුනා ඇත.

පාරින්ද රණසිංහ,
දිස්ත්‍රික් නඩුකාර තැන.

1970ක්වූ ජූලි මස 29 වන දිනදීය.

10-546

---

## ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේදීය

### නයිසයි ආඥාවයි

තෙස්තමේන්තු අංකය : 9288 මානවිල පදිංචිව සිට නැසීගිය යටවර ගමගේ පොඩි අප්පුහාමිගේ මුදලය පිළිබඳ කාරණාව ගැනයි.

මායාකඩුවෙගේ ඇල්පිනාහාමි, ගොරකගහවත්ත, මානවිල, වලහන්දූව .................................................. පෙත්සම්කාරිය.

එදිරිව

(1) යටවරගමගේ කල්යානවති, (2) යටවරගමගේ ගුණරත්න, (3) යටවරගමගේ ශ්‍රියානි, (4) යටවරගමගේ තිලක් පද්මිණී, (5) යටවරගමගේ චන්ද්‍රකාන්ති, (6) යටවරගමගේ නාලනී, (7) මායාකඩුවෙගේ චාර්ලිස් අප්පුහාමී. මේ අය මානවිල, වලහන්දූව පදිංචිය.................................. වගඋත්තරකරුවෝ.

පෙත්සම්කාරි වෙනුවෙන් ආර්. වික්‍රමසිංහ මහතා පෙනී සිටියදී වෂී 1970 මැයි මස 10 වන දින මෙය විභාගයට ගෙන පෙත්සම්කාරියගේ පෙත්සම සහ දිවුරුම් පත කියවා බලා, 1 සිට 6 දක්වා වූ බාල වයස්කාරයින්ගේ භාරකරු හැටියට 7වන වගඋත්තරකරු පත්කරන්නට යෙදෙන බවත්, පෙත්සම්කාරිය මියගිය අයගේ වැන්දඹුව බැවින් ඇය වෙත බලකඩදාසි නිකුත් කරනවාට කිසියම් කෙනෙක් විරුද්ධවේනම් එකී විරුද්ධවාදිකම් වෂී 1970 ජූලි මස 16 වන දින හෝ ඊට ප්‍රථම මෙම උසාවියට ඉදිරිපත් කරන ලෙසත්, තවද 7වන වගඋත්තරකරු එකී 1-6 දක්වාවූ බාල වයස්කාර වගඋත්තරකරුවන් එදිනම මෙම උසාවියට ඉදිරිපත් කරන ලෙසත් නියෝග කරන්නට යෙදුනා ඇත.

සී. වී. උදලාගම,
දිස්ත්‍රික් නඩුකාර තැන.

වෂී 1970 මැයි මස 10 වන දින දීය.

විරුද්ධවාදිකම් පෙන්වීමේ දිනය 13.9.70 දින තෙක් දීර්ඝ කරන ලදී.

සී. වී. උදලාගම,
දිස්ත්‍රික් නඩුකාර තැන.

විරුද්ධවාදිකම් පෙන්වීමේ දිනය 18.11.70 තෙක් දීර්ඝ කරන ලදී.

ඕ. ඊ. ධම්සේකර,
දිස්ත්‍රික් නඩුකාර තැන.

10-563

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් ඒය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.**

### උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| **ජූලි** | ... 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70 7 10 සිකුරාද | ... 70 7 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | ... 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | ... 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | ... 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| **අගෝස්තු** | ... 70. 8. 7 සිකුරාද | ... 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | ... 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | ... 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | ... 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| **සැප්තැම්බර්** | 70. 9. 4 සිකුරාද | ... 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | ... 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | ... 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | .. 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| **ඔක්තෝබර්** | ... 70.10. 2 සිකුරාද | .. 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | ... 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | ... 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | ... 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | .. 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| **නොවැම්බර්** | ... 70.11. 5 බ්‍රහස්පතින්ද | ... 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | ... 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | ... 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | .. 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| **දෙසැම්බර්** | ... 70.12. 4 සිකුරාද | ... 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | ... 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | ... 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | ... 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70 12.31 බ්‍රහස්පතින්ද | ... 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.